සවියෙන් පෙරට - අපි එකට

e – ඉගෙනුම් පාසල

*හොරණ අධ්‍යාපන කලාපය*



# 7 ශ්‍රේණිය: ඉතිහාසය- 1 වාරය

# 1 පාඩම: අපේ පැරණි ජන ජීවිතය










සැකසුම - කේ.එස් රංජනී - ගුරු උපදේශක

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - හොරණ

මේ පාඩම යටතේ අතීතයේ අපේ රටේ ජීවත් වූ වැසියන්ගේ ජන ජීවිතය සකස් වී තිබූ ආකාරය ඔබට ඉගෙන ගත හැකි වේ.

අතීතයේ අපේ රටේ ජීවත් වූ ජනතාවගේ ජීවන රටාව පහත සඳහන් පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ සිදු වී තිබේ

කෘෂිකර්මාන්තය

කර්මාන්ත

වෙළඳාම

# අපේ පැරණි ජනතාවගේ කෘෂිකර්මාන්තය සකස් වී තිබූ අයුරු



- කෘෂිකර්මාන්තය
  - ගොවිතැන
    - හේන් ගොවිතැන ( ගොඩ ගොවිතැන)
    - කුඹුරු ගොවිතැන ( මඩ ගොවිතැන)
  - සත්ව පාලනය

- පැරණි ජනතාව ගම්වල ජීවත් වූ අතර ඉතා සරල ජීවිත ගත කළහ
- බොහෝ දෙනාගේ ප්‍රධාන ජීවන වෘත්තිය වූයේ ගොවිතැනයි
- ගොවිතැන හැරුණු විට සත්ව පාලනය ද ප්‍රධාන ජීවන ක්‍රමයක් විය

# හේන් ගොවිතැන



- ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය යි
- මූලාශ්‍රවල හේන් වගාව හැඳින්වීමට විවිධ නම් භාවිත කර ඇත

උදා - උම්මග්ග ජාතකය - සේන්

සෙල්ලිපිවල - පිටබිම්

- හේනක් සකස් කරගත් ආකාරය

1 හේනක් සකස් කර ගැනීමට සුදුසු බිමක් තෝරා ගැනීම

2 කැලය කපා සුද්ද පවිත්‍ර කොට හේන ගිනි තැබීම

3 දූව දඬු ආදිය පුළුස්සා බිම සැකසීම



# නවදැලි හේන



- අලුතින් ගිනි තබා සකස් කරගත් භූමිය හඳුන්වන්නේ නවදැලි හේන නමින් ය.
- එවැනි හේනක් ඉතා සරුසාර භූමිය කි.



# අස්වැන්න නෙලා ගන්නා තුරු සතුන්ගෙන් හේන ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග

* දඬුවැට තැනීම
* ගිනිමැල ගැසීම
* පැල් රැකීම






# බෝග වගාවට හානි කිරීමට පැමිණි සතුන්



- අලි
- ඌරන්
- ගෝනුන්
- වඳුරන්
- ඉත්තෑවන්
- මුවන්




USHA HARISH






©Nuwan Chathuranga



# හේන්වල වගා කළ බෝග



**ධාන්‍ය**

- ඇල් වී
- තල
- තණහාල්
- මෙනේරි
- කුරක්කන්
- මුං

**එළවළු**

- තිබ්බටු
- වම්බටු
- අළු පුහුල්
- වට්ටක්කා
- මෑ

**අලවර්ග**

- බතල
- ඉන්නල
- අමු ඉඟුරු


Sesamum indicum
http://herbaledu.blogspot.com/


Thana Haal
Setaria italica (L.)
Group No 08

















alamy stock photo







# හේන් වගාවේ බස් වහර තේරුම් ගැනීමට ප්‍රයෝජනවත්වන පැරණි වචන



- **නවදැලි හේන** - අලුතින් ගිනි තබා සකස් කරගත් හේන
- **හැලිකටා** - හිසට වළඳක් නමා සාදා ගන්නා ලද පඹයා
- **ගිනි යාතිකාව** - හේන ගිනි තැබීමට පෙර සතුන් පන්නා හැරීමට සිදු කළ කෑ ගැසීම

# ගිනි යාතිකාව



- වේළුම් කා තිබෙන මේ වල් පැලැස්සේ ඉහළ පහළ ගොටා ගැහී, දරණ ගැහී , හිල් ගැහී ,වල් ගැහී, ඉන්න පා ඇත්තෝ, පා නැත්තෝ ,උර ගාන්නෝ ,තටු ඇත්තෝ ,තටු නැත්තෝ ,හන්දි ඇත්තෝ ,හන්දි නැත්තෝ ,එකී මෙකී කුරා කුඹියාගේ පටන් බූටාවේ මහ ඇත්තා (අලියා ) දක්වා වූ සෑම සියලු පරාණ කාරයෙක්ම මේ හූවෙන් මේ කැලෑ හේටියෙන් වල් වෙළුම් පැලැස්සෙන් පිටකං වෙන්ඩ එකං වෙන්ඩ වරමයි!


# කුඹුරු ගොවිතැන ( මඩ ගොවිතැන )







- වැව් අමුණු ඉදිකර ඇළ මාර්ග ඔස්සේ කුඹුරුවලට ජලය ලබාගෙන කුඹුරු වගා කර තිබේ
- සුළු වශයෙන් වර්ෂා ජලයෙන් ද කුඹුරු වගා කර තිබේ
- අනුරාධපුර රාජධානි සමයේ සෑම ගමකටම එක් වැවක් බැගින් තිබුණු බව සොයාගෙන ඇත
- එවැනි වැව් ගම් වැව් නමින් හඳුන්වයි
- ගම් වැව් තැනවූ අය හෝ එවැනි වැව් අයිතිව සිටි අය ශිලා ලිපිවල හඳුන්වා ඇත්තේ වැව් ගමික ,වපි හමික යන නම් වලිනි



- පසුකාලයේ දී රජවරු විශාල වැව් අමුණු ඉදි කළහ
- වාරි කර්මාන්තයට කළ විශිෂ්ට සේවය නිසා මින්නේරිය වැව තැන වූ මහසෙන් රජතුමා මින්නේරි දෙවියන් ලෙස ජනතාවගේ ගෞරවාදරයට ලක් විය
- වර්ෂයකට කන්න දෙකක් වී වගා කර තිබේ
- එනම් යල හා මහ කන්න දෙක ය
- මෙම කන්න දෙකට අමතරව මැද කන්නයක ද වී වගා කළ බවට තෝනිගල සෙල්ලිපියේ සඳහන් වේ
- අකලහස (මහ කන්නය)
- මදහස (මැද කන්නය)
- පිටදඩහස (යල කන්නය)



- මී ගවයන් බැඳි නගුල යොදා ගනිමින් වගාවට සුදුසු පරිදි කුඹුරේ පස බුරුල් කිරීම සී සෑම ලෙස හඳුන්වයි
- පුරාණ සී සෑමේ ක්‍රම පරිසරයට අහිතකර නොවීය

# වී වගාව ආරක්ෂා කර ගැනීමට භාවිත කළ සාම්ප්‍රදායික ක්‍රම



- නියරවල හා කුඹුරේ තැන තැන පොල්පිති සිටුවීම
- කෘමීන් මර්දනයට පහන් තිර පත්තු කිරීම
- මේ සඳහා රෙදි පාන්කඩ ඉරා තිර ලෙස අඹරා මී තෙලෙන් පොඟවා කදුරු කෝටුවල බැඳ සකස් කර තිබේ
- අළු ඉසීම

## කුඹුරු ගොවිතැන් කටයුතු සඳහා භාවිත කළ උපකරණ

- නගුල
- පෝරුව
- උදැල්ල
- දෑකැත්ත

## කුඹුරු ගොවිතැනේ දී භාවිත කළ වචන

ගොයම් මැඩීම - ගොයම් පෑගීම

ගොයම් කොළය - කපා ගත්

ගොයම් එකතු කර ගොයම් ගොඩ ගැසීම

කමත - ගොයම් පෑගීම සිදු කළ ස්ථානය

යතුර - කුල්ල

# වී බිස්ස

හොඳින් වේලා සකස් කරගත් වී, මෙම වී බිස්ස තුළ තැන්පත් කර ප්‍රයෝජනයට ගෙන ඇත



# සත්ත්ව පාලනය








# සත්ත්ව පාලනය



- කිරි ,බිත්තර, මස් ලබා ගැනීමට මෙන්ම කෘෂිකර්මාන්තය හා ප්‍රවාහන කටයුතු සඳහා සතුන් ඇති කිරීම
- ගවයා, එළුවා, කුකුළා, ඌරා වැනි සතුන් ඇති කිරීම
- පැරණි සමාජයේ ගවයා ඇති කරන ලද්දේ කිරි ලබා ගැනීමටත් ,ප්‍රවාහන කටයුතු හා කෘෂිකාර්මික කටයුතු සඳහාත් පමණි
- එකල ගවයාගේ මස් ආහාරයට ගෙන නැත
- කිරි ලබා ගැනීමට යොදාගත් යොදාගත් දෙනුන් කිරිගෙරි නමින් හඳුන්වා ඇත
- ගවයාගෙන් පස්ගෝ රස ලබාගෙන ඇත
- පස්ගෝ රස,

    කිරි

    දී කිරි

    මෝරු

    ගිතෙල්

    වෙඬරු

- **ගොපල්ලන්** - ගවයින් රැක බලා ගැනීම තණ කැවීම ආදියේ නිරත වු පුද්ගලයින්
- **ගෝපාලගාම** - එම පුද්ගලයින් විසූ ගම්
- මහාවංශයේ සඳහන් පරිදි පණ්ඩුකාභය රජතුමා ළමා කාලය ගත කරන ලද්දේ **දොරමඬලාව නම් ගොපලු ගමෙහි** ය.

# කර්මාන්ත



- අතීතයේ දී කර්මාන්ත බිහි වූයේ පැරණි ජනයාගේ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීමට ය
- විශේෂ හැකියා ඇති පිරිස් (ශිල්පීන්) මෙම කර්මාන්තවල නියැලුණි

**අතීතයේ පැවති කර්මාන්ත කිහිපයක්**

යකඩ

තඹ

රන්

රිදී






NMEC
National Museum of Egyptian Civilization
13


EXPLORE
SRI LANKA
Once discovered, you must explore...



# අතීතයේ පැවති කර්මාන්ත කිහිපයක්



| කර්මාන්තය | නිෂ්පාදනය සඳහා භාවිත කළ උපකරණ | ශිල්පීන් හැඳින්වූ නම | නිෂ්පාදිත ද්‍රව්‍ය |
|---|---|---|---|
| යකඩ | මයිනහම | කබර ,කම්මාර ,ලෝකුරුවන් | යකඩ ඇණ<br>උදලු<br>කැති |
| මැටි | සකපෝරුව | කුම්භකාර | මැටි වළං<br>උළු<br>ගඩොල් |
| පේෂ | නූල් කටින අත් යන්ත්‍ර | පෙහෙකාර | රෙදි |
| රන් | - | ස්වර්ණකාර | රන් වළළු<br>රන් මාල<br>කරාබු |
| මැණික් | මැණික් ඔප දමන යන්ත්‍ර | මණිකාර | මැණික් ඔබ්බවන ලද ආභරණ |

# වෙළඳාම

වර්තමානයේ මෙන් අතීතයේ ද වෙළඳාම ආකාර දෙකකින් සිදු විය.

- වෙළඳාම
  - අභ්‍යන්තර වෙළඳාම (රට ඇතුළත )
  - බාහිර වෙළඳාම (විදේශ රටවල් සමග )

| පිටරටින් ගෙන ආ භාණ්ඩ | පිටරට යැවූ භාණ්ඩ | ගනුදෙනු කළ විදේශ රටවල් |
|---|---|---|
| පිගන්<br>සේද රෙදි<br>සුවඳ විලවුන්<br>අශ්වයින් | ඇත්දළ<br>මුතු මැණික්<br>කුළු බඩු<br>ඇතුන් | ඉන්දියාව<br>චීනය<br>රෝමය<br>අරාබිය<br>පර්සියාව |

# විදේශ වෙළඳාම පැවති බවට හමුවන සාධක





චීන කාසි



හස්ඵබු කාසි





රෝම කාසි

# අතීතයේ වෙළඳ ගනුදෙනු සිදු වූ පැරණි වරායන්



- මාතොට ( මහාතිත්ථ/ මාන්තායි )
- ගෝකණ්ණ ( වර්තමාන ත්‍රිකුණාමල වරාය )
- ගොඩවාය ( වර්තමාන හම්බන්තොට වරාය )




# ශ්‍රී ලංකාවේ පැරණි වරායන්

# ලංකාවේ පැරණි වෙළඳ නීති ඇතුළත් හෝපිටිගමු (බදුලු) ටැම් ලිපිය



- මෙම ටැම් ලිපිය හතරවන උදය රජු විසින් පිහිටුවන ලද්දකි.
- හෝපිටිගමු වෙළඳපොළෙහි පාලනයේ සිදු වූ අකටයුතුකම් වැළැක්වීමට රජු විසින් මෙම ටැම් ලිපිය පිහිටුවා ඇත.
- මෙය බදුලු ටැම් ලිපිය ලෙසත් සොරබොරවැව ටැම් ලිපිය ලෙසත් හඳුන්වනු ලබයි.
- මෙහි ඇතුළත් නීති කිහිපයකි .
- වෙළඳපොළට පැමිණෙන කරත්ත වලින් මිස වෙළඳපොළ පසු කරගෙන යන කරත්ත වලින් බදු අය නොකළ යුතු යි.
- පොහොය දිනවල දී වෙළඳාම් නොකළ යුතු යි.
- එසේ යම් අයෙක් වෙළඳාම් කළහොත් මහියංගන විහාරයට තෙල් බද්දක් ගෙවිය යුතු යි.
- බුලත් ,පුවක් වැනි දේ ආවරණය කරන ලද මණ්ඩපවල තබා විකිණිය යුතු යි.
- අනුමත කළ තරාදි පඩි භාවිත කළ යුතු යි .
- වෙළඳපොළට ගෙනෙන බඩු පෙර මගට ගොස් නොගත යුතු යි.



# පැරණි සමාජයේ සංස්කෘතිය සකස්ව පැවති ආකාරය



- අත්තම් ක්‍රමය - එකිනෙකාට ප්‍රති උපකාර කර ගැනීමයි ( කුඹුරු වැඩ වලදී ,නිවෙස් වල වහල සෙවිලි කිරීමේදී ).
- විවාහය - අතීතයේ විවාහ ක්‍රමය චාම් අර්ථවත්ව හා ගෞරවාන්විතව සිදු විය.
- දෙමව්පියන් තම පෙළපතට පවුලට ගැළපෙන විවාහයක් තම දූ පුතුන්ට සිදු කර දී තිබේ.
- අවමංගල්‍ය - විවිධ ජන කොටස්වලට වෙන් වූ සුසාන භූමි තිබී ඇත.
- මෘතදේහ වනගත සොහොන්වල තැන්පත් කිරීමත් ,අදාහනයෙන් පසුව භෂ්මාවශේෂ භූමදානය කිරීමත් සිදු කර ඇත.
- සිරිත් විරිත් හා සාරධර්ම - වැඩිහිටියන්ට ගරු කිරීම, දෙමාපියන්ට සැලකීම, සිරිත් විරිත් නොපිරිහෙලා ඉටු කිරීම පැරණි ජනයා අකුරටම ඉටු කර ඇත.

සවියෙන් පෙරට - අපි එකට

e – ඉගෙනුම් පාසල

*හොරණ අධ්‍යාපන කලාපය*

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 1 | 1. අපේ පැරණි ජන ජීවිතය<br>ඇගයීම |

සැකසුම - කේ.එස් රංජනී - ගුරු උපදේශක
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - හොරණ

## පැරණි කෘෂි කර්මාන්තය

1. හේනක් සකස් කර ගැනීමේ දී අනුගමනය කළ යුතු කරුණු තුනක් ලියන්න

2. හේනක අස්වැන්න නෙලා ගන්නා තුරු සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් ලියන්න

3. හේන්වල වගා කළ ධාන්‍ය ,එළවළු හා අල වර්ගවල නම් තුන බැගින් වගුවක ඇතුළත් කරන්න

4. තෝනිගල සෙල්ලිපියේ සඳහන් වන වී වගා කළ කන්න තුන හඳුන්වන නම් ලියන්න

5. වී වගාව ආරක්ෂා කර ගැනීමට භාවිත කළ සාම්ප්‍රදායික ක්‍රම තුනක් ලියන්න

## පැරණි කර්මාන්ත හා සමාජ සංස්කෘතිය

1. පැරණි කර්මාන්ත ඇසුරින් පහත වගුව පුරවන්න

| කර්මාන්තය | ශිල්පීන් හඳුන්වා ඇති නම | නිෂ්පාදනය කළ භාණ්ඩ |
|---|---|---|
| යකඩ | | |
| රන් | | |
| තඹ | | |
| මැටි | | |
| පේෂ | | |
| මැණික් | | |

2. හෝපිටිගමු වෙළඳපොළ පාලනය සඳහා හතරවන උදය රජතුමා විසින් පනවා තිබූ නීති දෙකක් සඳහන් කරන්න

3. අතීතයේ අප රටෙහි පැවති විදේශ වෙළඳාම සම්බන්ධ තොරතුරු ඇසුරෙන් පහත වගුව පුරවන්න

| වෙළඳාමට සම්බන්ධ රටවල් | අපනයනය කළ භාණ්ඩ | ආනයනය කළ භාණ්ඩ | ශ්‍රී ලංකාවේ පැරණි වරායන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

4. අතීත සමාජයේ රජවරු පවා තම මව්පියන්ට උපස්ථාන කළ බවට තොරතුරු මහාවංශයේ සඳහන් වේ . එලෙස තම මවට උපස්ථාන කළ රජතුමකු නම් කර එම කථා පුවත කෙටියෙන් විස්තර කරන්න

සවියෙන් පෙරට - අපි එකට

e – ඉගෙනුම් පාසල

*හොරණ අධ්‍යාපන කලාපය*

| ශ්‍රේණිය<br>7 | විෂයය<br>ඉතිහාසය | වාරය<br>1 | පාඩම<br>1. අපේ පැරණි ජන ජීවිතය<br>පිළිතුරු |
|---|---|---|---|

සැකසුම - කේ.එස් රංජනී-ගුරු උපදේශක
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය-හොරණ

## <u>පැරණි කෘෂි කර්මාන්තය</u>

1. I. සුදුසු බිමක් තෝරා ගැනීම

   ii. කැලය කපා සුද්ද පවිත්‍ර කිරීම

   iii. දූව දඬු ආදිය පුළුස්සා බිම සැකසීම

2. දඬු වැට තැනවීම ,ගිනිමැල ගැසීම, පැල් රැකීම

3.

| ධාන්‍ය | එළවළු | අලවර්ග |
|---|---|---|
| ඇල් වී | තිබ්බටු | බතල |
| තල | වම්බටු | ඉන්නල |
| තණහාල් | අළු පුහුල් | අමු ඉඟුරු |
| මෙනේරි | වට්ටක්කා | |
| කුරක්කන් | මෑ | |
| මුං | | |

4. අකලහස ,මදහස ,පිටදඬහස

5. * කුඹුරේ තැන තැන පොල්පිති සිටුවීම

   *රෙදි පාන්කඩ තිර ලෙස අඹරා මී තෙලෙන් පොඟවා කදුරු කෝටුවල බැඳ පත්තු කිරීම

   * අළු ඉසීම

# පැරණි කර්මාන්ත හා සමාජ සංස්කෘතිය

1.

| කර්මාන්තය | ශිල්පීන් හඳුන්වා ඇති නම | නිෂ්පාදනය කළ භාණ්ඩ |
|---|---|---|
| යකඩ | ලෝකුරු/ කබර /කම්මාර | කෘෂි උපකරණ ( කැති /උදලු) |
| රන් | ස්වර්ණකාර | මාල/වළලු/කරාබු |
| තඹ | තඹකර | තඹ නිර්මාණ ( හෙප්පු/ පහන් ) |
| මැටි | කුම්භකාර | වළං /උළු/ගඩොල් |
| පේෂ | පෙහෙකාර | රෙදිපිළි |
| මැණික් | මණිකාර | මැණික් ආභරණ |

2.

- වෙළඳපොළට පැමිණෙන කරත්ත වලින් මිස වෙළඳපොළ පසු කරගෙන යන කරත්ත වලින් බදු අය නොකළ යුතු යි.
- පොහොය දිනවල දී වෙළඳාම් නොකළ යුතු යි.
- එසේ යම් අයෙක් වෙළඳාම් කළහොත් මහියංගන විහාරයට තෙල් බද්දක් ගෙවිය යුතු යි.
- බුලත් ,පුවක් වැනි දේ මණ්ඩපවල තබා විකිණිය යුතු යි.
- අනුමත කළ තරාදි පඩි භාවිත කළ යුතු යි.
- වෙළඳපොළට ගෙනෙන බඩු පෙරමගට ගොස් නොගත යුතු යි.

3.

| වෙළඳාමට සම්බන්ධ රටවල් | අපනයනය කළ භාණ්ඩ | ආනයනය කළ භාණ්ඩ | ශ්‍රී ලංකාවේ පැරණි වරායන් |
|---|---|---|---|
| ඉන්දියාව | ඇත්දළ | අශ්වයින් | මාතොට/මහාතිත්ථ |
| චීනය | ඇතුන් | පිඟන් | ගෝකණ්ණතිත්ථ |
| රෝමය | මුතු | සේදරෙදි | ගොඩවාය |
| අරාබිය | මැණික් | සුවඳවිලවුන් | |
| පර්සියාව | කුළුබඩු | | |

4.

- *අටවන අග්ගබෝධි රජතුමා* තම මවට උපස්ථාන කිරීම.
- දිවා රාත්‍රී මවට උපස්ථාන කිරීමෙන් රජු බොහෝ සතුටට පත්ව ඇත.
- තෙල් ගල්වා ,හිස පිරිමැද, දහඩිය පිරිසිදු කොට සුවඳ විලවුන් ගල්වා ඇය සැතැප්පීය.
- නිය කපා පිරිසිදු කොට ඇය නැහැවීය.
- සුව පහසු ඇඳුම් අන්දවා , තම දෑතින් ම කිලිටි වස්ත්‍ර පිරිසිදු කළේ ය.